**සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල - 2016**

---

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ 8(5) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI – 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

ප්‍රමිතයේ 53 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය කාලපරිච්ඡේදයේ සංඛ්‍යාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ගිණුම්කරණ සටහන් ඒ අනුව ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

ප්‍රමිතයේ ඡේද අංක 15 ප්‍රකාරව, අවසන් තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට මැනිය යුතු වුවද, ඊට පටහැනිව පිරිවැය මත ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

(i) ප්‍රමිතියේ ඡේද අංක 13 ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ හඳුනාගැනීමේදී අදාළ වත්කම භාවිතය සඳහා තිබෙන වත්කමක් විය යුතු වුවද, 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල සතුව භාවිතයේ නොපැවති රු. 32,542,118 ක් වූ මෝටර් වාහන මූල්‍ය ප්‍රකාශන වල දේපල, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර සමාලෝචිත වර්ෂය සඳහා රු.6,508,424 ක ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය රු.6,508,424 ක් අඩුවෙන් සහ දේපල පිරියත හා උපකරණවල දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය රු.26,033,694 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය ආරම්භ වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් කර තිබුණු, අරමුදල සතු රු. 25,831,545 ක් පිරිවැය වූ විවිධ වත්කම් වර්ග 6ක් සමාලෝචිත වර්ෂය අවසානයේ දේපල, පිරියත හා උපකරණ වටිනාකම තුළ ඇතුළත් කර තිබුණු අතර භාවිතා කළ නොහැකි වත්කම් නිශ්චිතව හඳුනාගෙන අපහරණය කිරීමට හෝ භාවිතා කළ හැකි වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් කොන්ත්‍රාත් 36 කට අදාළව සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රැඳවුම් මුදල් රු. 34,978,798 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයට අදාළ රු. 1,993,911 ක් වූ වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ ජනවාරි මාසයට අදාළ එකතු කල අගය මත බදු රු.4,988,559 ක් සමාලෝචිත වර්ෂයේදී උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ ලාභය අඩුවෙන් සහ උපචිත වියදම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) දෙහිවල සත්වෝද්‍යානයේ වෙළඳ කුටියකින් ලැබිය යුතු කුලී මුදල් හා ලැබිය යුතු විදුලි ගාස්තුව පිළිවෙලින් රු. 874,930 ක්, රු. 13,642 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඉ) දෙහිවල සත්වෝද්‍යානයේ ආපනශාලා දෙකක බදු කුලිය ප්‍රමාද වීම මත ගිවිසුම ප්‍රකාරව අයවිය යුතු රු. 149,080 ක ප්‍රමාද ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) පින්නවල වාගොල්ල නව සත්වෝද්‍යානයේ පිහිටි සමරු අලෙවිසැල 2016 ජූනි 15 දින සිට ආපසු භාර දී තිබියදීත් 2016 ජූලි මාසයට අදාළ කුලී ආදායම ඇතුළුව රු. 30,390 ක් ලැබිය යුතු කුලී ආදායම් ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) 2014 වර්ෂයේදී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සතුන් මිලදී ගැනීමේ වැය ශීර්ෂය යටතේ රු. 5,000,000 ක් වැයකර මිලදී ගත් පැස්බරුන් 4 දෙනෙකු 2016 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වල ප්‍රදර්ශන සතුන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

## 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

2016 දෙසැම්බර් 31 දිනට ණය හිමි ශේෂය වූ රු.340,982 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් සහිත විස්තරාත්මක උපලේඛණයක් සහ ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.3 ලැබිය යුතු ගිණුම්

දෙහිවල සත්වෝද්‍යානයේ කුරුළු උයන අසල වෙළඳ කුටිය පවත්වාගෙන ගිය පෞද්ගලික පාර්ශවයක් විසින් 2016 මාර්තු සිට මැයි දක්වා කාලයට අදාළව රු. 1,540,930 ක කුලී මුදල් සහ විදුලි ගාස්තු රු. 13,642 ක් ගෙවීමකින් තොරව ආපනශාලාව වසා දමා තිබුණු අතර එම ගාස්තු අයකර ගැනීමට අරමුදල විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි138 (8)(9) | වියදම සහතික කරන නිලධාරියෙකු විසින් වවුචර් නිවැරදි සහ සෑම අතින්ම සම්පූර්ණ බවට වගකිව යුතු වුවද, භාණ්ඩ ඇණවුම් හා භාණ්ඩ භාරගැනීමේ තුණ්ඩු වල ඡායා පිටපත් පදනම් කොටගෙන සත්ව ආහාර මිලදී ගැනීම සඳහා රු. 841,567 ක් ගෙවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 237 (අ),(ආ) | සත්ව ආහාර වශයෙන් සපයනු ලබන එළවළු, පලතුරු, මස් සහ ෆොරේජ් ආහාර ගිවිසුම ප්‍රකාරව, සතුටුදායක ලෙස සැපයීම් කර ඇති බවට සහතිකයකින් තොරව හා භාණ්ඩ සැපයුම් කර ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව රු. 113,582 ක් ගෙවීම් කර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371(2)(අ) | වියදම් සඳහා සුළු මුදල් අග්‍රිමයක් නිකුත් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී හම්බන්තොට රිදීයගම සෆාරි උද්‍යානයේ වියදම් සඳහා උද්‍යානය භාර නිලධාරියා වෙත අවස්ථා 10 කදී පෞද්ගලික මුදලින් දරන ලද රු. 350,695 ක වියදම් ප්‍රතිපූරණය කර තිබුණි. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.4. (ඇ) | කොන්ත්‍රාත්තුවක් සඳහා ලංසු කැඳවීමේ ලේඛණ නිර්මාණය කිරීම හෝ සකස් කිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීමට සේවයේ යොදවනු ලැබූ යම් කොන්ත්‍රාත්කරුවෙකුට එම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු නොලැබිය යුතු වුවත්, දෙහිවල සත්වෝද්‍යානයේ නිදහස් අලි අරණ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධව උපදේශන සේවා සැපයීම හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව එකම සැපයුම්කරුවකු වෙත ප්‍රදානය කර තිබුණි. |
| (ඇ) ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලියවිල්ල | |
| ICTAD/SBD/04 හි අංක 8.1 හා 8.3 ඡේදය | කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 50 ක් වූ හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඕස්ට්‍රේලියානු කලාපයේ ඉදිකිරීම් කටයුතු මාර්ගෝපදේශය ප්‍රකාරව අප්‍රමාදව අවසන් කළ යුතු වුවත්, වැඩ අවසන් කළ යුතු දිනය වූ 2017 මාර්තු 09 දින වන විටත් වැඩබිම එළිපෙහෙළි කිරීම පමණක් සිදුකර තිබුණි. තවද, ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් විස්තරාත්මක කාල සටහනක් වැඩ ආරම්භක දින සිට දින 07 ක් ඇතුළත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 581,182,256 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 631,057,480 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 49,875,224 කින් පිරිහී තිබුණි. අරමුදලේ දල ලාභය රු.28,235,006 කින් වැඩිවී තිබුණද වෙනත් වියදම් රු. 80,547,567 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2012 වර්ෂයේදී රු. 397,537,423 ක් වූ අතිරික්තය 2015 වර්ෂය අවසානයට රු.631,057,480 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු. 581,182,256 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේවුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවන ලද බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 432,641,277 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.719,861,014 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4. 1 කාර්යසාධනය

(අ) 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනත අනුව අරමුදලේ අරමුණු පහත පරිදි වේ.

(i) ජාතික සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදලේ පරිපාලන කටයුතු වෙනුවෙන් නිලධාරීන් සහ සේවක පිරිසක් බඳවා ගැනීම.

(ii) දෙහිවල සත්වෝද්‍යානය නැරඹීම සඳහා පැමිණෙන්නන්ගේ වාහන නවතා තැබීම පිණිස විශේෂ පෙදෙස් සැපයීම.

(iii) උද්‍යානය තුළට තහනම් දෑ ගෙන එන්නේදැයි පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.

(iv) සත්වෝද්‍යානයේ සේවා නියුක්තිකයන්ට සුභසාධන හා දිරිගැන්වීමේ යෝජනා ක්‍රම සැලැස්වීම.

(v) සත්ව උද්‍යානය සම්බන්ධයෙන් වූ සියලු කාරණා හා ප්‍රශ්න පිළිබඳව අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම හා අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් උපදේශක කාරක සභාවක් පත් කිරීම.

(vi) ඉහත උපදේශක කාරක සභාවේ රැස්වීම් යටත් පිරිසෙයින් සෑම වර්ෂයකම දෙවරක් පැවැත්වීම.

ඉහත සඳහන් අරමුණු 06 අතුරින් අරමුණු 05 ක් ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර උද්‍යානය තුළට තහනම් දෑ ගෙන එන්නේදැයි පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම පමණක් ඉටුකර තිබුණි.

(ආ) 2016 වර්ෂය තුළ සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සතු දෙහිවල ජාතික සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, වාගොල්ල නව සත්වෝද්‍යානය සහ හම්බන්තොට රිදීයගම සෆාරි උද්‍යානය නැරඹීම සඳහා පැමිණි නරඹන්නන් සංඛ්‍යාව සහ එමගින් ලද ආදායම ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| සත්වෝද්‍යානය | වර්ගීකරණය | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|
| | | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | ලද ආදායම (රු.) | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | ලද ආදායම (රු.) |
| දෙහිවල සත්වෝද්‍යානය | දේශීය | 1,318,185 | 104,052,560 | 1,392,217, | 110,518,710 |
| | විදේශීය | 30,402 | 48,004,950 | 32,334 | 50,321,200 |
| පින්නවල අලි අනාථාගාරය | දේශීය | 734,699 | 54,730,570 | 666,881 | 49,915,190 |
| | විදේශීය | 362,662 | 765,973,750 | 381,105 | 788,248,500 |
| පින්නවල වාගොල්ල නව සත්වෝද්‍යානය | දේශීය | 333,219 | 25,848,250 | 267,656 | 20,972,850 |
| | විදේශීය | 2,213 | 1,735,750 | 1,838 | 1,509,250 |
| හම්බන්තොට රිදීයගම සෆාරි උද්‍යානය | දේශීය | - | - | 217,207 | 48,560,000 |
| | විදේශීය | - | - | 499 | 991,250 |
| **මුළු එකතුව** | | 2,781,380 | 1,000,345,830 | 2,959,737 | 1,071,036,950 |

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පින්නවල අලි අනාථාගාරයට පැමිණි දේශීය නරඹන්නන් සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 67,818 කින් එනම් සියයට 9 කින් පහළ වැටීමකට ලක්ව තිබුණු අතර ආදායමද රු. 4,815,380 කින් එනම් සියයට 9 කින් පිරිහීමට ලක් වී තිබුණි.

(ii) 2015 අප්‍රේල් 17 දින ආරම්භ කර තිබුණු පින්නවල වාගොල්ල නව සත්වෝද්‍යානය නැරඹීමට පැමිණි විදේශීය හා දේශීය නරඹන්නන් සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් 65,563 ක් හා 375 ක් හෙවත් සියයට 20 කින් හා සියයට 17 කින් අඩුවී තිබුණි. ඒ අනුව, ඉන් ලද මුළු ආදායමද ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 5,101,900 කින් එනම් සියයට 19 කින් පිරිහී තිබූ බව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ පිහිටි ආහාර අලෙවිසැල් දෙකක් සහ එක් සමරු අලෙවිසැලක්ද, හම්බන්තොට රිදීයගම සෆාරි උද්‍යානයේ ආපනශාලාවක් සහ සමරු අලෙවිසැලක්ද ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව බදු කුලී පදනම මත ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය, මිල්කෝ (පුද්ගලික) සමාගම හා වනජීවී භාරය වෙත ලබාදී තිබුණි. හම්බන්තොට රිදීයගම සෆාරි උද්‍යානයේ ආපනශාලාව සහ සමරු අලෙවිසැල බදුදීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව සමග ලිඛිත බදු කුලී ගිවිසුමකට එළඹ නොතිබුණු අතර වනජීවී භාරය වෙත ලබාදී තිබු කිසිදු වෙලදසැළක් සම්බන්ධයෙන් ලිඛිත බදු කුලී ගිවිසුමකට එළඹීමට හා කුලී අයකර ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වාගොල්ල සත්ව උද්‍යානය හා හම්බන්තොට රිදීයගම සෆාරි උද්‍යානය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. 45,003,804 ක් වූ ප්‍රාග්ධන වියදම් අරමුදලින් දරා තිබුණද මෙම සත්වෝද්‍යාන සඳහා පනතේ නීතිමය විධිවිධාන සලසා ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

2016 වර්ෂයේ සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ සංශෝධිත ඇස්තමේන්තුව අනුව, අලෙවි ප්‍රවර්ධන හා ප්‍රචාරණය, අධ්‍යාපන හා පර්යේෂණ වියදම් වෙනුවෙන් වෙන්කල රු. 2,500,000 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබුණි. එසේම සත්වෝද්‍යාන 04 ක සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ රු.480,000,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු. 408,947,493 ක් එනම් සියයට 85 ක්ද, නව ඉදිකිරීම් සඳහා යන්ත්‍රෝපකරණ හා වෙනත් මිලදී ගැනීම් වෙනුවෙන් වෙන් කළ රු.30,000,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු. 29,887,820 ක් එනම් සියයට 99.6 ක් ද උපයෝජනය නොකොට ඉතිරි වී පැවතුණි.

## 4.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, සමාලෝචිත වර්ෂය තුළදී අවසන් කිරීමට සැලසුම් කර තිබුණු වටිනාකම රු. 131,000,000 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක් 2017 වර්ෂයට කල් දමා තිබුණි. එය මුළු ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවෙන් සියයට 27 ක් විය. කෙසේ වුවත්, 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට මෙම ඉදිකිරීම් ව්‍යාපෘති ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුව හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරීමට යෝජිත, වටිනාකම රු. 107,000,000 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 10 කට අදාළව මූලික අත්තිකාරම් නිදහස් කිරීම, සැලසුම් නිර්මාණ කටයුතු සිදුකිරීම හා ප්‍රමාණ පත්‍ර සකස් කිරීම යන මූලික කටයුතු පමණක් සිදුකර තිබු බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, 2016 දෙසැම්බර් 31 දින වන විට වැඩ අවසන් කළ යුතු දෙහිවල සත්වෝද්‍යානයේ ඉදිකිරීමට යෝජිතව තිබූ නව සත්ව රෝහල් ගොඩනැගිල්ලේ සැලසුම් කටයුතු අවසන් කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොතිබුණි.

(ඈ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, පින්නවල වාගොල්ල නව සත්වෝද්‍යානයේ සේවා ගොඩනැගිලි අසල මායිම් තාප්පයේ ඉතිරි වැඩ 2016 දෙසැම්බර් 31 දින වන විට අවසන් කළ යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දින වන විට එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පින්නවල අලි අනාථාගාරයේ ආරක්ෂිත බැම්ම හා ආරක්ෂක කුටිය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2016 නොවැම්බර් 24 දිනැති ව්‍යාපෘතිය ප්‍රදානය කිරීමේ ලිපිය අනුව, අදාළ ලිපියේ දින සිට දින 14 ක් ඇතුළත මූලික වැඩ කටයුතු ආරම්භ කළ යුතු වුවත්, ලිපියේ දින සිට දින 47 ක් ගතවීමෙන් පසු වැඩ ආරම්භ කර තිබුණි. 2017 අප්‍රේල් 09 දක්වා ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණද, විගණිත දිනය වූ 2017 ජූනි 28 දින වන විටත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර විෂයයන් 08ක් සම්බන්ධයෙන් සියයට 82 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. අරමුදලින් සිදු කෙරෙන නව ඉදිකිරීම් හා සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ සියලු විස්තර ඇතුළත් කොන්ත්‍රාත් ලේඛනයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතු වේ.